&× ´ {ÆæÈ à`ÑÍ ó
All Rights Reserved

පළමු වාර පරීක්ෂණය 2015
ගෘහ ආර්ථික විද්‍යාව

11 ශ්‍රේණිය **කාලය පැය 02 යි. වි. 30 යි.**

නම/ විභාග අංකයඃ

I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ලැක්ටෝස්වල අඩංගුවන්නේ,
 (1) ග්ලූ හා ෆෘක්ටෝස් (2) ලිනොලෙයික් අම්ලය
 (3) ග්ලූකෝස් අණු 4 කි. (4) ග්ලූකෝස් හා ග්ලැක්ටෝස්

02 පෙක්ටින් යනු
 (1) ශාකමය ආහාරවල අඩංගු කාබෝහයිඩ්‍රේට් වර්ගයකි.
 (2) බිත්තරවල අඩංගු ප්‍රෝටීන්ය.
 (3) ධාන්‍යවල අඩංගු ද්‍රව්‍යයකි.
 (4) ජෙලටින්වලට සමාන පදයකි.

03 නීරක්තියට හේතුවන විටමිනයකි.
 (1) නයසින් (2) ෆෝලික් අම්ලය
 (3) පිරිඩොක්සින් (4) ඇරකිඩොනික්

04 ග්ලයිකෝජන් බහුල ආහාරයකි,
 (1) මාළු (2) මස් (3) පිකුදු (4) හාල්මැස්සො

05 සංතෘප්ත මේද අම්ලයකි,
 (1) ලිනොලෙනික් අම්ලය (2) පාමටික් අම්ලය
 (3) ඔලෙයික් අම්ලය (4) ලිනොලෙයික් අම්ලය

06 ෆ්ලෝරයිඩ් ඌණවීමෙන් සිදුවන්නේ,
 (1) දත් දිරායාම (2) දත්මුල් දිරායාම
 (3) දත් මුල් දියවීම (4) විදුරුමස් තුවාලවීම

07 විටමින් A කුමන අවස්ථාවක පසුවන්නන් වැඩිපුර ගත යුතුද?
 (1) ක්ෂීරණ අවස්ථාව (2) ගර්භනී අවස්ථාව
 (3) ළදරු අවස්ථාව (4) මහළු අවිදිය

08 ධාන්‍ය හා මාෂ බෝග අඩංගු ආහාර පිළිවෙලින්
 (1) පරිප්පු හා කව්පි (2) තිරිඟු හා සහල්
 (3) කඩල හා සහල් (4) තිරිඟු හා මුංඇට

09 බිත්තරවල අඩංගු ප්‍රෝටීනය
 (1) මයොසීන් (2) ලෙගියුමින් (3) ඇල්බියුමින් (4) කේසීන්

10 ආහාර පිරමීඩයේ පහළින්ම දක්වා ඇත්තේ
 (1) මාෂ බෝග හා සත්ත්ව ආහාර (2) කිරි හා කිරි ආහාර
 (3) තෙල් හා සීනි (4) මාෂ බෝග හා කිරි ආහාර

11 ඉතාමත් කෙට්ටු සිරුරක් ඇත්තෙකු පිළිබිඹු කරන ඌණතා රෝගය
 (1) බෙරිබෙරි රෝගය (2) මැරස්මස්
 (3) ඔස්ටියෝපොරෝසිස් (4) මාන්දම

12 පිටිමෝලි සෑදීමේ දී එකතු කරන පිපුම්කාරක මගින් සිදුවන ක්‍රියාවක් නොවන්නේ,
 (1) රසය වැඩිදියුණු කිරීම. (2) ප්‍රමාණයෙන් විශාලවීම.
 (3) සැහැල්ලු බවක් ඇතිවීම. (4) මෘදුබවක් ඇතිවීම.

13 දියාරු පිටි මෝලියකින් සෑදිය හැකි ආහාරයකි,
 (1) බනිස් (2) මුං කැවුම් (3) පැන්කේක් (4) පැටිස්

14 විදේශගත මිතුරියකගේ පැමිණීම නිසා ඇයට මේසය සැකසිය යුතු වන්නේ,

(1) පෙරදිග අවිධිමත් ක්‍රමයට (2) පෙරදිග විධිමත් ක්‍රමයට

(3) ස්වයං සේවා ක්‍රමයට (4) අපරදිග විධිමත් ක්‍රමයට

15 අභ්‍යන්තර සාධකයක් ලෙසින් ආහාර නරක්වීමට භාජනය වන සාධක නම්

(1) ඔක්සිජන් හා PH අගය (2) PH අගය හා ජලය

(3) ප්‍රශස්ත උෂ්ණත්වය හා ජලය (4) ක්ෂුද්‍රජීවීන් හා ජලය

16 රසායනික හේතුවක් මගින් ආහාර නරක්වීමට බලපාන සාධකයකි

(1) ජලය (2) වාතය (3) එන්සයිම (4) ක්ෂුද්‍රජීවීන්

17 පැස්ටරීකරණයේ දී

(1) අහිතකර බැක්ටීරියා විනාශ වේ. (2) අහිතකර බැක්ටීරියා අඩපණ වේ.

(3) සියලුම බැක්ටීරියා විනාශ වේ. (4) කිරි දිගුකාලීනව කල්තබා ගත හැක.

18 දක්කු රේඛා සලකුණු කරන්නේ,

(1) පැන්සල (2) දැති රෝදය (3) අඩිරූල (4) මිනුම් පටිය

19 දිග කොට මැස්ම

(1) සැටින් මැස්මේ ප්‍රභේදයකි. (2) පිස්මේන්තු මැස්මේ ප්‍රභේදයකි.

(3) ස්ථිර මැහුම් විශේෂයකි. (4) අස්ථිර මැහුම් ක්‍රමයකි.

20 ළදරු කමිසයක කර නිමකිරීමට යෝග්‍ය නොවන්නකි,

(1) ඇඹරුම් වාටිය (2) සිප්පි වාටිය

(3) පයිපිං කිරීම (4) බඳන වාටිය

21 ළදරු කමිසයක විවරය පියවීමට සුදුසු වන්නේ,

(1) සැනගාංචු ඇල්ලීම (2) ටේප් ඇල්ලීම

(3) බොත්තම් ඇල්ලීම (4) හක් හා මුදු

22 මූට්ටුවක නොමැසූ අද්දර නිමකිරීම සඳහා භාවිතා කරන්නේ,

(1) බ්ලැන්කට් මැස්ම (2) සැටින් මැස්ම

(3) දම්වැල් මැස්ම (4) බොත්තම් කාස මැස්ම

23 වාටියක් මැසීමට භාවිතයට ගන්නා මැහුම් ක්‍රමයකි,

(1) වාටි මැස්ම (2) පිස්මේන්තු මැස්ම

(3) හීන් නූල් දුවවීම (4) බොරු නූල් දුවවීම

24 වාටි මැස්ම අරඹන්නේ

(1) ගැටයක් යෙදීමෙන් (2) පිස්මේන්තු මැස්මෙන්

(3) නූල සඟවමින් මැසීමෙන් (4) එකම තැන තුන්වරක් මැසීමෙන්

25 රූප සටහනේ දැක්වෙන්නේ,

(1) සරල මූට්ටුව

(2) ප්‍රංශ මූට්ටුව

(3) පැතලි මූට්ටුව

(4) අතිඡාදන මූට්ටුව



26 ඩිම්බයක සක්‍රීය කාලය

(1) දින 3 5 (2) දින 2 3

(3) දින 5 8 (4) දින 7 14

27 නවජ දරුවාගේ ප්‍රතීක ක්‍රියාවක් නොවන්නේ,

(1) කිරි උරාබීමය (2) තිගැස්සීමය (3) නිඳාගැනීමය (4) හැඬීමය

28 ළදරුවාට පළමුව දෙනුලබන එන්නත

(1) හෙපටයිටීස් B (2) ඉන්ෆ්ලුවෙන්සා

(3) බී. සී. ජී. (4) ජර්මන් සරම්ප

29 සති 5 ක් ගර්භාෂය තුළ වැඩෙන සජීවී ප්‍රාණියා හඳුන්වන්නේ,

(1) භ්‍රෑණය (2) කලලය

(3) යුක්තාණුව (4) ඩිම්බය

30 ළදරුවකුට අතිරේක ආහාර ලෙස ආරම්භයේ දී ම ලබාදෙන්නේ,

(1) ධාන්‍ය කැඳ (2) කොත්තමල්ලි වතුර

(3) එළවලු සුප් දියර (4) පලතුරු යුෂ

31 උදෑසන ඔක්කාරය ගර්භනී මුල් සමයේ ඇතිවන්නේ,

(1) ජීරණ එන්සයිම හේතුවෙනි. (2) ආහාර වැඩියෙන් ගැනීමෙනි.

(3) වැඩිපුර පාන වර්ග ගැනීමෙනි. (4) හෝමෝන අසමතුලිතතාවයෙනි.

32 අඩු බර උපතක් යනු,

(1) 3000g අඩු බර උපත් (2) 5000g අඩු බර උපත්

(3) 1500g අඩු බර උපත් (4) 2500g අඩු බර උපත්

33 කක්කල් කැස්ස වැළැක්වීමට දෙනුලබන එන්නත වන්නේ,

(1) MR එන්නත (2) DPT එන්නත

(3) MMR එන්නත (4) BCG එන්නත

34 මෙයින් මානව නොවන සම්පත් වන්නේ,

(1) කාලය, දේපල, මුදල් (2) දේපල, ආකල්ප, මුදල්

(3) මුදල්, ශ්‍රමය, ඉඩකඩ (4) ඉඩකඩ, කාලය, කුසලතා

35 ගෘහීය සම්පත් මනාව කළමනාකරණය කළයුත්තේ,

(1) සීමිත බැවිනි. (2) බෙදාහදා ගතයුතු බැවිනි.

(3) මිල අධික බැවිනි. (4) අසීමිත බැවිනි.

36 විස්තෘත පවුල පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) තීරණ ගැනීම පහසුය.(2) සහයෝගීතාවය වැඩිය.

(3) පෞද්ගලිකත්වය ආරක්ෂා වේ. (4) මුදල් පාලනය පහසුය.

37 පවුලක වියදම් සැලසුම් කිරීම මගින්

(1) ආහාර සඳහා වැඩියෙන් වියදම් කළ හැක.

(2) අත්‍යාවශ්‍ය වියදම් කළ නොහැක.

(3) ඉතිරි කිරීම්වලට යොමුවිය හැක.

(4) විනෝදාංශවලට මුදල් වෙන්කළ හැක.

38 කාමරයක් තුළ ඉඩකඩ කළමනාකරණය කිරීමට කළ යුත්තේ

(1) බහුකාර්ය උපකරණ යොදාගැනීම.

(2) දොර ජනෙල් වසා තැබීම.

(3) කාමරය තුළ ගෘහ භාණ්ඩ නොතැබීම.

(4) කුඩා ගෘහ භාණ්ඩ පමණක් තැබීම.

39 ගෘහයක භෞතික සංවිධානයේ දී අත්‍යාවශ්‍ය කොටස් තුනකි.

(1) ගබඩා කාමරය, කෑම කාමරය, විසිත්ත කාමරය

(2) ආලින්දය, විසිත්ත කාමරය, මුළුතැන්ගෙය

(3) විසිත්ත කාමරය, මුළුතැන්ගෙය, නිදන කාමරය

(4) ගබඩා කාමරය, කෑම කාමරය, මුළුතැන්ගෙය

40 ගෘහ උපාංග 2 කි.

(1) ලාම්පු ආවරණය, කුෂන් කවර (2) කුෂන් කවර, කුෂන්

(3) ඔරලෝසුව, ඉටිපන්දම් ධාරකය (4) බිත්ති සැරසිලි, ඔරලෝසුව

II කොටස

- **පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.**

01 (1) ඒකීය පවුල හඳුන්වන තවත් නම් 2 ක් ලියන්න.

(2) පවුලක මානසික සම්බන්ධතා පවත්වා ගැනීමෙන් ඇතිවන වාසි 3 ක් ලියන්න.

(3) මූලික ආහාර කාණ්ඩ 4 ක් දක්වන්න.

(4) කිලෝ කැලරිය අර්ථ දක්වන්න.

(5) ඛනිජ වර්ග බෙදෙන කොටස් 2 ක් ලියන්න.

(6) ආහාර පිසීම යනු කුමක් ද?

(7) ආහාර පිසීමේ දී භාවිතා වන තාප සංක්‍රමණ ක්‍රම මොනවාද?

(8) ආහාර පිළිගැන්වීමේ ප්‍රධාන ක්‍රම මොනවාද?

(9) ආහාර නරක්වීම කෙරෙහි බලපාන හේතු මොනවාද?

(10) අධි පෝෂණය නිසා ඇතිවිය හැකි රෝග තත්ත්ව 3 ක් නම් කරන්න. (ල. 40)

02 (1) පවුලේ ආදායම් වර්ගීකරණය ලියන්න.

(2) භෞතික සම්පත් 3 ක් නම් කරන්න.

(3) කාර්යක්ෂම කළමනාකරණය තුළින් අත්වන වාසි මොනවාද? (ල. 10)

03 (1) ඇඳුම් නිර්මාණයේ දී භාවිතා වන මෙවලම් 5 ක් නම් කරන්න.

(2) ළදරු ඇඳුම් සඳහා සුදුසු රෙදි වර්ග 3 ක් ලියන්න.

(3) රෙදි පිරියම් කිරීම යනු කුමක් ද? (ල . 10)

04 (1) ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ කොටස් 3 නම් කර ඒවායේ ක්‍රියාකාරීත්වය ලියන්න.

(2) පූර්ව ප්‍රසව සංවර්ධනයේ අවධි හා කාලය දක්වන්න.

(3) මාතෘ සායනවලින් සැපයෙන සේවා 3 ක් ලියන්න. (ල . 10)

05 (1) යෞවනෝදයේ අවධි කීයද? ඒ මොනවාද?

The National e-Learning Portal for the General Education